## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492
## ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

---

## பாராளுமன்ற வெளியீட்டுத் தொடர் எண் 492
## நிறுவனத்தின் பெயர்: மாவட்ட செயலகம் – மாத்தறை

நாடாளுமன்றத்தின் பொதுக் கணக்குகள் குழு சமர்ப்பித்த அறிக்கைகள் தொடர்பாக, கௌரவ அமைச்சர் அவர்களால் நிலை ஆணை எண் 119(4)-இன் கீழ் எடுக்கப்பட்ட அவதானிப்புகள் மற்றும் நடவடிக்கைகள் குறித்த நாடாளுமன்றச் சமர்ப்பணம்

---

## Parliamentary Publication Series No. 492
## Name of Institution: District Secretariat – Matara

Submission of observations of Hon.Minister and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of standing order No. 119(4)

ඇමුණුම 01

<u>ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119(4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.</u>

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර**

**<u>පළමු කොටස:</u>**

| රා.ගි.කා. සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම් | ගණන් දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියාමාර්ග | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| අනවසර අල්ලා ගැනීම් පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ලේඛනයක් පවත්වාගෙන යාමට උපදෙස් දෙන ලදී. | 2024 වර්ෂයේ සිට මීට අදාලව ලේඛනයක් පවත්වාගෙන යන බව කාරුණිකව වාර්තා කරමි. |
| දීර්ඝ කාලීන බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ලේඛනයක් පවත්වාගෙන යාමට උපදෙස් දෙන ලදී. | 2024 වර්ෂයේ සිට මීට අදාලව ලේඛනයක් පවත්වාගෙන යන බව කාරුණිකව වාර්තා කරමි. |
| වියදම් උපයෝගීතා ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | වියදම් උපයෝගීතා ලේඛනයක් පවත්වාගෙන යා යුතු බවට ඊට අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | 2026 වර්ෂයට අදාලව සහ ඉදිරියට මේ වන විට වියදම් උපයෝගීතා ලේඛනය පවත්වාගෙන යන බව කාරුණිකව දන්වමි. |
| අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | මීට අදාල නිලධාරීන් සමග සාකච්ඡා කර ඉදිරියට මෙම ලේඛනය පවත්වාගෙන යා යුතු බවට උපදෙස් දෙන ලදී. | පෙන්වා දී ඇති අඩුපාඩු ඉදිරියේදී නිවැරදි කර මෙම ලේඛනය පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට උපදෙස් ලබා දී ඇත. | මේ වන විට 2024 හා 2025 වර්ෂ වල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත. |
| වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට උපදෙස් ලබා දී ඇත. | මේ වන විට 2024 හා 2025 වර්ෂ වල වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇත |
| විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දීමේ අවශ්‍යතාවය සියලුම අංශ භාර නිලධාරීන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇත.<br>සංකීර්ණ හා තාක්ෂණික කරුණු සහිත විගණන විමසුම් හැර ඉතිරි විගණන විමසුම් වලට හැකි | 2022 වර්ෂය සඳහා විගණන විමසුම් 36 ක් සහ 2023 වර්ෂය සඳහා විගණන විමසුම් 149 ක් ලැබී තිබුණු අතර එම සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු සපයා ඇත. 2024 වර්ෂයේ විගණන විමසුම් 55 ලැබී තිබුණු අතර එම විගණන විමසුම් 55 වම |

| | | |
|---|---|---|
| | ඉක්මනින් පිළිතුරු සැපයිය නොහැකි අවස්ථා වලදී අතුරු පිළිතුරු යැවීමට උපදෙස් ලබා දී ඇත. | පිළිතුරු සපයා ඇත. එමෙන්ම 2025 වර්ෂයේ විගණන විමසුම් 110 ක් ඉදිරිපත් කර තිබූ අතර එම සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු සපයා ඇත. 2026 වර්ෂයේ සිට සෑම විගණන විමසුමක් සඳහාම මසක් ඇතුළත පිළිතුරු සැපයීමට කටයුතු සිදුකරගෙන යන බව දන්වමි. |
| අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්ථා විය | විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු ලබා දීමේ අවශ්‍යතාවය සියලුම අංශ භාර නිලධාරීන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇත.<br>සංකීර්ණ හා තාක්ෂණික කරුණු සහිත විගණන විමසුම් හැර ඉතිරි විගණන විමසුම් වලට හැකි ඉක්මනින් පිළිතුරු සැපයිය නොහැකි අවස්ථා වලදී අතුරු පිළිතුරු යැවීමට උපදෙස් ලබා දී ඇත. | 2023 වර්ෂයට අදාලව විගණන විමසුම් 13 ක් ලැබී ඇති අතර මින් විමසුම් 08 ක් සඳහා මසක් ඇතුළත පිළිතුරු සපයා ඇත. 2024 හා 2025 වර්ෂවලට අදාලව ලැබුණු විගණන විමසුම් වලින් බහුතරයකට මසක් ඇතුළත පිළිතුරු ලබා දී ඇත. කෙසේ නමුත් සමහර විගණන විමසුම් වලට පිළිතුරු ලබා ගැනීමේ ප්‍රමාදයන් හේතුකොටගෙන මසක් ඇතුළත පිළිතුරු සැපයීම ප්‍රමාද වී ඇති බව දන්වමි. |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන කමිටුව අවම ප්‍රමාණයෙන් හෝ රැස්ව නැත. | ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ ඊට අදාල අනෙකුත් කාර්යමණ්ඩලය දැනුවත් කර ඇත. | 2024 හා 2025 වර්ෂවල අවම වශයෙන් විගණන කලමනාකරණ කමිටු රැස්වීම 04 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ට අදාලව පවත්වා ඇත. |
| සියලුම වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් සහ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර මේ අනුව ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුවත් කර ඇත. | පවතින වාහන වල කොටසක රාජ්‍ය ලාංඡනය පින්තාරුකර ඇති අතර එසේ නොමැති සියළුම වාහන වල ඉදිරියෙන් හඳුනාගත හැකි පරිදි අදාල කාර්යාලය දැක්වෙන පරිදි නාම පුවරුවක් ඇතුළත් කර ඇති බව දන්වමි. |
| සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් සහ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර මේ අනුව ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුවත් කර ඇත. | වාහන වලට අදාලව මේ වන විට ලොග් පොතක් පවත්වාගෙන යන බවත් එය ඉදිරියටත් පවත්වාගෙන යන බවත් වාර්තා කරමි. |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | චක්‍රලේඛ ප්‍රකාරව හිඟ ණය ශේෂයන් ප්‍රමාදයකින් තොරව කඩිනමින් අය කර ගන්නා ලෙස සියළුම විෂය නිලධාරීන් සහ අදාල මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කර ඇත. | මීට අදාලව රු.7500/-ක එක් ණය ශේෂයක් පවතින බවත් ඊට අදාල නිලධාරියා සොයා ගැනීමට අපහසු බැවින් තව දුරටත් නිරවුල් කිරීමට නොහැකි වී ඇත. |

| | | |
|---|---|---|
| පොදු තැන්පත් ගිණුමෙහි කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 571 ප්‍රකාරව අවු. 2 කට වැඩි තැන්පතු නිරවුල් කරන ලෙස ඊට අදාල විෂය නිලධාරීන් සහ මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කර ඇත. | වර්ථමානය වන විට මු.රෙ. 571 ප්‍රකාරව නිරවුල් කිරීමට නොහැකි ණය ශේෂයන් පවතින අතර එයට හේතු වී ඇත්තේ ඊට අදාල විගණන විමසුම් පවතින බැවිණි. |
| මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 10 ක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | සියළුම මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කර කඩිනමින් අතුරු අග්‍රිම නිරවුල් කරන ලෙස දන්වා ඇත. | පාලනය කළ නොහැකි හේතූන් මත සිදුවන ප්‍රමාදයන් හැර, ලබා දුන් තත්කාර්ය අතුරු අග්‍රිම දින 10 ක් ඇතුළත පියවන බව දන්වා සිටිමි. |
| ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සිදුව තිබුණි. | මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී ඇති නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. | 2024 සහ 2025 වර්ෂ වල මෙම තත්ත්වය මගහරවා ගෙන ඇති අතර ඉදිරියටද එසේ ප්‍රතිපාදන ඉක්මවා කටයුතු නොකරන බව කාරුණිකව දන්වමි. |

<u>දෙවැනි කොටස:</u>

| | | |
|---|---|---|
| මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පවත්වා නොතිබුණි. | දේශපාලන අධිකාරිය දැනුවත් කර මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පැවැත්විය යුතු බව දැනුවත් කර ඇත. | දේශපාලන අධිකාරිය විසින් තීරණය කරනු ලබන දින වකවානු වල මාසික දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු පවත්වන බව දන්වමි. |
| දිස්ත්‍රික් ලේකම් විසින් කැදවනු ලබන ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබුණි. | මීට අදාල මාණ්ඩලික නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර වර්ෂය මුල අදාල වර්ෂයට අදාලව, මාසික දිනයක් වෙන් කිරීමට උපදෙස් දෙන ලදි. | 2024 සහ 2025 වර්ෂයන්ට අදාල මාසිකව ප්‍රාදේශීය ලේකම් කමිටු පවත්වා ගෙන යන බව කාරුණිකව දන්වමි. |
| දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස්වී නොතිබුණි. | මීට අදාලව මෙම නිවාස කමිටුව මාසිකව රැස්විය යුතු බවට අදාල උපදෙස් නිකුත් කර ඇත. | 2026 වර්ෂයේ සිට මෙම කමිටුව රැස්වන බව කාරුණිකව දන්වමි. |
| දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස්වී නොතිබුණි | මෙම කමිටුව මාසිකව රැස්විය යුතු බවට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | දැනට යල සහ මහ කන්න වලදී වර්ෂයට දෙවරක් ලෙස මෙම කමිටුව රැස්වන අතර ඉදිරියේදී මසකට වරක් රැස්වීමට අවශ්‍ය කටයුතු යොදන බව කාරුණිකව දන්වමි. |
| දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටුව මාසිකව රැස්වී නොතිබුණි. | මෙම කමිටුව මාසිකව රැස්විය යුතු බවට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | පවතින තත්ත්වයන් යටතේ අවශ්‍යතාවය මත මෙම කමිටුව රැස්වන අතර ඉදිරියේදී මසකට වරක් රැස්වීමට අවශ්‍ය කටයුතු යොදන බව කාරුණිකව දන්වමි. |
| 2018.01.24 දිනැති අංක 05/218(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති | මෙම චක්‍රලේඛයට අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙළ කර ක්‍රියාත්මක කළ | වර්ථමානය වන විට මෙම පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිවැරදිව සකස් කර ක්‍රියාත්මක |

| | | |
|---|---|---|
| අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | යුතු බවට උපදෙස් දෙන ලදි. | කරනු ලැබේ. |
| ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | මෙම පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය අධීක්ෂණය කිරීමට හා ඇගයීමට නිසි ක්‍රමවේදයක් සකස් කර පවත්වාගෙන යා යුතු බව අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | වර්ථමානය වන විට මීට අදාල අධීක්ෂණ හා ඇගයීම් ක්‍රමවේදයක් පවත්වාගෙන යන බව දන්වමි. |
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරන ලද මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 02/2018 චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර පවත්වාගෙන යා යුතු බවට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදි. | 2025 වර්ෂයේ සිට මෙම ආයතනයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම පවත්වාගෙන යන බව දන්වමි. |
| සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 ට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. | මීට අදාලව සියළුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථා සෑම නිලධාරියෙකුටම ලබා දිය යුතු බවට අවශ්‍ය උපදෙස් අදාල මාණ්ඩලික නිලධාරීන්ට ලබා දී ඇත. | 2025 වර්ෂයට අදාලව සියළුම නිලධාරීන්ට අවම පැය 12 ක පුහුණු අවස්ථා ලබා දී ඇති බව කාරුණිකව දන්වමි. |
| සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගත කරන බව දැනුවත් කර ඇත. | සකස් කිරීමට කටයුතු කරමින් පවතින අතර 2026.12.31 දිනට ප්‍රථම අදාල කාර්ය සාධන ගිවිසුම් සකස් කර අවසන් කරන බව වාර්ථා කරමි. |
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය | මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පැහැදිලි මතයක් ලබා ගත යුතු බවට සහ ඊට අදාල ක්‍රියාමාර්ග සැලසුම් කර ගත යුතු බවට සියළුම නිලධාරීන් දැනුවත් කර ඒ සම්බන්ධව වැඩි අවධානයක් යොමු කරන ලෙස ගිණුම් අංශයට උපදෙස් දෙන ලදි. | වර්ථමානය වන විට මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව යටත්ව මතයක් ලබාගෙන ඇති බව දන්වමි. |
| සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන ඉලක්ක නියමිත දිනට ඉදිරිපත් කර නොමැත. | සෑම වර්ෂයකදීම ඊට අදාලව ලබා දෙනු ලබන ඉලක්ක සහ කාර්ය සාධන මට්ටමට ලගා විය යුතු බවට පසු විපරම් කරන ලෙසට සියළුම නිලධාරීන් දැනුවත් කර ඇත. | 2024 සහ 2025 වර්ෂ වල ලබා දී ඇති ඉලක්ක හා කාර්ය සාධන වලට ලගා වූ බව දන්වමි. |
| හදුනාගත් කාර්ය දර්ශකයේ ලගා | නියමිත කාර්ය දර්ශකයේ ඉහල | 2024 හා 2025 වර්ෂ වලදී 75% |

| | | |
|---|---|---|
| විම 24% ට වඩා අඩු ප්‍රමාණයෙන් විය. | අගයකට ලගා වීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදි. | කට වඩා වැඩි ප්‍රගතියක් ලගා කරගෙන ඇති බව දන්වමි. |
| දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට 01 බැගින් රැස්වී නොතිබුණි. | චක්‍රලේඛන ප්‍රකාරව ඉදිරියේදී දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්විය යුතු බවට උපදෙස් දෙන ලදි. | 2025 සහ 2026 වර්ෂ වලට අදාලව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වෙන බව කාරුණිකව දන්වමි. |
| දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට එක් වරක් රැස් වී නොතිබුණි. | අදාල චක්‍රලේඛනය පරිදි දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව රැස්විය යුතු බවට උපදෙස් දෙන ලදි. | 2024 වර්ෂයේ සිට දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව නියමිත පරිදි රැස්වන බව දන්වා සිටිමි. |
| සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | පවතින ප්‍රතිපාදන සීමාව තුළ ඉදිරියේ දී අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අතිරේක පුහුණුවක් ලබා දෙන මෙන් අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | 2025 වර්ෂයට අදාලව මෙම ඉලක්ක සම්පූර්ණ කර ඇති බව කාරුණිකව වාර්තා කරමි. |
| රජයේ ගිණුම් පිළිබද කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි. | පෙන්වා දී ඇති නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | වර්ථමානය වන විට පෙන්වා දී ඇති සියළුම නිර්දේශ සහ නියෝග ක්‍රියාත්මක කර ඇති බව කාරුණිකව දන්වමි. |
| දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 02 කට වරක් රැස්වී නොතිබුණි. | චක්‍රලේඛන ප්‍රකාරව පරිසර කමිටුව ඉදිරියේදී පැවැත්විය යුතු බව අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | 2025 වර්ෂයේ සිට පරිසර කමිටු රැස්වීම් පවත්වාගෙන යන බව කාරුණිකව දන්වමි. |
| තිරසර සංවර්ධන හා වන ජීවී අමාත්‍යාංශයේ 2016.11.17 දිනැති අංක SDW/3/3/16-2016 චක්‍රලේඛයේ උපදෙස් පරිදි වන අලි හානි හා වෙනත් වන සතුන්ගෙන් සිදුවන හානි පිළිබද වන්දි කමිටුව රැස්වී නොතිබුණි. | අදාල නොවේ. | අදාල නොවේ. |
| විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියට එවැනි අඩුපාඩු මගහරවා ගෙන කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත. | පෙන්වා දී ඇති අඩුපාඩු සියල්ල මේ වන විට නිවැරදි කර ගෙන ඇති බව වාර්තා කරමි. |

දිස්ත්‍රික් ලේකම්/දිසාපති
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මාතර

බී. වී. චන්දන තිලකරත්න
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
මාතර

ප්‍රධාන ගණකාධිකාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මාතර

ටී. ජී. එම්. සුධර්ම
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මාතර.

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළගා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරශ්‍රය - කොළඹ 07.